ආසියාවේ පළවන එකම කතෝලික ළමා පුවත් පත
LP - QD / 21/ News/ 2012

ක්‍රි. ව. 2013 ජනවාරි 14 සඳුදා
05 වෙළුම - 11 කලඹ
සතිපතා පත්‍රය - පිටු 16
මිල රු 10.00

# ළමා ප්‍රදීපය





සිතුවම : මේරියන් කාසිචෙට්ටි

# ලක්දිව ධර්මදූතවරයාණෝ ජුසේ වාස් පියතුමා !

ළමා ප්‍රදීපය
ආරම්භය - 2008 ඔක්තෝබර් 06 සඳුදා

කොළඹ කතෝලික මුද්‍රණාලය, කොළඹ 08. / දුරකතන අංකය - 2695984 / 4899611
ෆැක්ස් : 2692586 - ඊ-මේල් pradeepaya@yahoo.com
වෙබ් අඩවිය - www.colombocatholicpress.lk

# ක්‍රිස්තියානි කලාව හා වන්දනාව

**ආදරණීය දුවේ පුතේ...**

මේ වසරේ පටන් ''ළමා ප්‍රදීපය'' තවත් අලුත් විශේෂාංග යක් ඔබ වෙනුවෙන්ම ඉදිරිපත් කරනවා. ඒ ක්‍රිස්තියානි කලාව හා වන්දනාව පිළිබඳ ලිපි මාලාවයි. ලෝකයේ තිබෙන විවිධ ආගම් අතරින් විශිෂ්ටතම කලාවක් හා වන්දනා ක්‍රමයක් උත්තරීතරව උරුම කරගත් එකම ආගම බවට ක්‍රිස්තියානිය නම් දරා තිබෙනවා. එය සෑම ශත වර්ෂයකම ජීවත්ව සිටි අද්විතීය විද්වතුන් ආගම් භේදයකින් තොරව පිළිගත් මතයක්. ක්‍රිස්තියානි කලාව එහි විකාශනය විවිධ ගෘහ නිර්මාණ ශිල්ප ක්‍රම, ''මොසැයික්'' හෙවත් වීදුරු කැට කලාව, අයිකොන් රූපකලාව, දේවස්ථාන ගොඩ නැගීමේ කලාව යනාදී මුළු ලොවටම බල පැවැත්වූ කලා විශේෂයන් අප ක්‍රිස්තියානිය සතුව පවතිනවා. ඒ පමණක් නොවෙයි, සංගීතය, නාට්‍ය, සිනමා මේ හැම ක්ෂේත්‍රයකම මූලාරම්භය ක්‍රිස්තියානිය සතුවීමම එහි ඇති මාහැඟි බව සැබැවටම දනවනවා.

ආදර දුවේ පුතේ, ක්‍රිස්තියානිය ඇදහීම මරණ දණ්ඩනය හිමිවන වරදක් සේ සැලකුණු යුගය ක්‍රි.ව. 313දී කොන්ස්තන්තීනු අධිරාජයා විසින් නිකුත් කරන ලද මිලාන් ආඥාවෙන් අවසන් වුනා. එතැන් සිට ක්‍රිස්තියානිය රෝම අධිරාජ්‍ය තුළ නිදහසේම ඇදහිය හැකි ආගමක් බවට පත්වුනා. ඒ නිදහසත් සමගම තම ආගම අදහමින් සිටි බැතිමතුනට එයින් ලැබුණ සහනය හා සැනසීම මැනිය නොහැකි තරම් වුනා. ඒ නිසාම ඉන් පසුව එළි දැක්වුන ඉදිරි සියවස ක්‍රිස්තියානියේ ස්වර්ණමය යුගය බවට පත්වුනා. ඒ අනුව සභා සංවිධානය අතින්ද, චින්තනය අතින්ද , ඒ සියල්ලටත් වඩා කලාව අතින්ද නව යුගයක් බිහිවන්නට වුනා.

එහිදී විශේෂිතම ලක්ෂණය වූයේ දේවස්ථාන ගොඩ නැගීම පිළිබඳව ඇතිවුන පුනරුද යුගයයි. මන්ද සංකේතාත්මකව කිතුනු බැතිමතුන් වැඩිවත්ම ඔවුනට එක්රැස් වන්නට දේවස්ථාන වැඩි වශයෙන් අවශ්‍ය වන්නට වුනා. නමුත් ඒ අවශ්‍යතාවය සඳහා ඔවුනට දේවස්ථාන තිබුනේ නැහැ. කලින් ඔවුන් එක් එක් නිවෙස් වල එකතු වුවත් නිදහසින් පසුව සාමූහිකව එක්කාසු වන්නට තරම් සමත් ගොඩනැගිලි පිළිබඳව ඔවුන් සිතන්නට වුනා. එකල රෝම අධිරාජ්‍ය තුළ රෝම ආගමේ දේවාල හැම නගරයකම දක්නට ලැබුනා. එයට නොදෙවෙනි ආකාරයට ක්‍රිස්තු භක්තිකයින්ටත් තමන්ගේ වන්දනාමාන සඳහා දේවස්ථාන ගොඩ නැගීමේ ප්‍රබල ආශාව පැන නැගුණා. රෝම දේවාල පිටතින් විශාල වුනත් ඇතුලතින් ඒවා කුඩා තත්ත්වයේ පැවතුනේ. එම නිසා ක්‍රිස්තියානින් එම නිර්මාණ ශිල්පය අනුගමනය කරන්නට පෙළඹුනේ නැහැ. ඔවුන් අනුගමනය කළේ රෝම වරුන්ගේ ''බැසිලිකා'' යනුවෙන් හැඳින්වුන ජන රැස්වීම් ශාලා ආකෘතියයි. ''බැසිලිකා'' නමින් හැඳින්වුන රැස්වීම් ශාලා , නඩු විභාග වලටද පොදුජන රැස්වීම් වලටද උත්සව වලටද යොදා ගත හැකි වන විලාශයට ප්‍රමාණයෙන් බොහෝ විශාල වුනා.

ආදර දුවේ පුතේ, කොන්ස්තන්තීනු රජතුමාගේ කාලයේ රෝම පුරවරයේ අරඹන ලද හැම දේවස්ථානයකටම මුල් වුයේ එම බැසිලිකා ආකෘතියයි. ඒවා පළලට වඩා දිගින් වැඩිවූ සෘජු චතුරශ්‍ර ගොඩනැගිලි වුවා. ප්‍රායෝගික අගයකින් යුක්තවූ මෙම චාම් ගොඩ නැගිලි ක්‍රමය රෝම අධිරාජ්‍යයේ විශේෂයෙන්ම බටහිර කොටසේ හැම තැනකම පාහේ යොදගනු ලැබුවා. ශත වර්ෂ දහසකට වඩා පැරණි මෙම ආකෘතිය අද පවා බහුලව යොදා ගනු ලබනවා. දිගින් හා පළලින් එක හා සමාන වූ හරි හත රැස් දේවස්ථානද, කුරුසියක හැඩයට තනනු ලැබූ දේවස්ථානද එහිදී දක්නට ලැබෙනවා. එහෙත් හතරවෙනි ශත වර්ෂයේ රෝම පුරයේ තනනු ලැබූ ප්‍රධාන දේවස්ථාන හතර වන සාන්ත පේදුරු දේවස්ථානය, සාන්ත පාවුළු දේවස්ථානය, සාන්ත ජෝන් ලැටරන් දේවස්ථානය හා සාන්ත මේරි මේජර් දේවස්ථානය සඳහා සුළු වෙනස්කම් සහිතව යොදා ගනු ලැබුවෙත් එම ආකෘතියයි. රෝමානු දේවස්ථාන ක්‍රමය සේ හැඳින්වුයේ එම ක්‍රමයයි.

ආදර දුවේ පුතේ ඉදිරියටත් අපි මේ ක්‍රිස්තියානි ගෘහ නිර්මාණ ශිල්පය හා වන්දනාව ගැන තවත් විස්තර සහිතව කතා කරනවා. අද අපි කතා කළ මේ සුළු කොටසින් හා විශේෂාංගයක් සේ ඔබ වෙත ගෙන එනු ලබන ඒ ලිපියෙන් පෙන්නුම් කර දෙන කරුණු තවත් ඔබේ ශක්තියෙන් හදාරන්නට උත්සහ කරන්න.

ඔබේ මීසමේ ගොඩ නංවා ඇති දේවස්ථානයේ ආකෘතිය පිළිබඳව දැන් ඔබට යම් අධ්‍යයනයක් කරන්නට පුළුවන්, මේ දෙව්මැදුරු ආවාට ගියාට ගොඩ නැගූ ගොඩනැගිලි නොවෙයි. යම් තේරුමක් ඇතිවයි ඒවා ගොඩ නංවා තිබෙන්නෙ.

ඉතිං මේ වසර තුළ ''ළමා ප්‍රදීපය'' ගෙන එන මේ විශේෂාංගය හොඳින් කියවා අධ්‍යයනය කරන්න. අපේ පැරණි ක්‍රිස්තියානි කලාව ගැන හොඳින් අධ්‍යයනය කර ඒ ආශ්‍රයෙන් ඔබේ නිර්මාණ නැවතත් ''ළමා ප්‍රදීපය'' වෙතටම යොමු කරන්න.

**ඔබට ජේසු පිහිටයි.**

සංස්කාරක

**ගරු ශාන්ත සාගර හෙට්ටිආරච්චි පියතුමා**

# ළමා ඔබට සිතුවිල්ලක්

**වැලිවිට එම්.ජෝ.පාරිස් මාමා විසිනි.**

**ඉතින් දයාබර දුවේ පුතේ, නිදි යහන පමණක් නොවේ. ඔබ පාඩම් කරන මේසය, මේසයේ ලාච්චු ඔබගෙ කාමරය, ඇඳුම් අල්මාරිය, ඔබගේ පොත් පත්, පෑන පැන්සල, මකනය පවා ලස්සනට , පිළිවෙලට තියාගන්නට වෙරදරන්න. ගෙවල් , දොරවල්, මිදුල් අතුගාල නිතරම ලස්සනට , පිළිවෙලට පවත්වාගන්නට අම්මට උදව්වෙන්න. උදව් දෙන්න.**



බහ තෝරන අවධියේ පටන්ම යහපත් පුරුදු, හොඳ ක්‍රියාවනට පුරුදු වෙනවා කියන එක සම්පූර්ණ ජීවිතයම ආලෝකමත් වෙනවා. 1950 ගණන්වල කුරුණෑගල පදවියේ මාවතගම මීසම භාරව හිටියා ගරු එඩ්වඩ් පීරිස් කියලා පියතුමෙක්. ඉතින් ඒ ස්වාමි හරියට දක්ෂයි ජනහිත කාමියි.

කුරුණෑගල දිස්ත්‍රික්කයේ මාවතගම, වැඋඩ, බක්මීගොල්ල, මැල්සිරිපුර, ආදී ප්‍රදේශ ආශ්‍රිතව අලුතෙන් දේවස්ථාන හදලා එතුමා විශාල කිතුනු නවෝදයක් ඇති කළ පියතුමෙක්.

ඉතින් දුවේ පුතේ, ඒ ස්වාමිගේ කටේ නිතරම තිබුන කියමනක් තමයි. ''පුතේ දවස පටන් ගන්න ඕනැ නිදි යහනෙන්'' කියලා. ඒ කියමනෙන් ගරු පියතුමා අදහස් කලේ උදේ පාන්දර නිදි යහනෙන් නැගිට්ට හැටියෙම ඇඳ ඇතිරිල්ල, කොට්ට , මෙට්ට රැල්ලක්වත් නොතියෙන විදියට සකස්කරලා , මදුරු දැළ ලස්සනට හකුලල තියල ආපසු හැරිල ඇඳ දෙස බලන්නලු දෙපාරක්, තුන් පාරක් පමණ බලන්නලු.

ඇඳ ලස්සනට පිළිවෙලට තියෙන විදිය දැක්කම සිතට දැනෙන සතුට, ප්‍රීතිය කියල නිම කරන්නට බැරිලු.

හැබැයි ඒ එක්කම කරන්නට තවත් දෙයක් තියෙනවලු. ඒක තමයි දවස ආරම්භයේම කළයුතු දේ ඔබට ලබාදුන්න මෙම ලස්සන දවස ගැන දෙවිඳුන්ට තුති පුදන්නටත් දවස අර්ථාන්විතව ගත කරන්නට අවැසි දිරිය ශක්තිය ලබාදෙන්නට කියලා ජේසුට පුදන්නටත් ඕනැ.

ඉතින් දුවේ පුතේ, ඒ කරුණු දෙක පිළිවෙලට කළවිට ඔබට දවසේ ඉතිරි කොටස ආශාවෙන් ප්‍රීතියෙන් , දිරියෙන් යුක්තව ගෙවා දමන්නට හොඳ පන්නරයක් වෙනවා.

මමත් ඒ ක්‍රියාවන් දශක හයක්, ඒ කියන්නෙ අවුරුදු හැටක් තිස්සෙම ක්‍රියාවට නංවනවා. අත් විඳිනව. ඒකෙන් මම දෛනිකව ලබන තෘප්තිය කියලා නිම කරන්න බෑ.

ඉතින් දයාබර දුවේ පුතේ, නිදි යහන පමණක් නොවේ. ඔබ පාඩම් කරන මේසය, මේසයේ ලාච්චු ඔබගෙ කාමරය, ඇඳුම් අල්මාරිය, ඔබගේ පොත් පත්, පෑන පැන්සල, මකනය පවා ලස්සනට , පිළිවෙලට තියා ගන්නට වෙරදරන්න. ගෙවල් , දොරවල්, මිදුල් අතුගාල නිතරම ලස්සනට , පිළිවෙලට පවත්වාගන්නට අම්මට උදව්වෙන්න. උදව් දෙන්න.

ඔබට දවස ගතකරන්නට පුදුම ආශාවක් ශක්තියක් ඇතිවේවි. ඔබගේ පාසල් කටයුතු අධ්‍යාපන කටයුතු නිසිලෙස ඉටුකරන්නට ඔබගේ ඇඳේ පිලිවෙත මහගු පිටිවහලක් වේවි.

ඉතින් දයාබර දුවේ පුතේ, මේ වසර ආරම්භයේ පටන්ම මේ ක්‍රියාව අත්හදා බලන්න. අවුරුද්ද අවසාන වෙනකොට ඔබට හිතෙයි ඔබ කොතරම් සාර්ථක දරුවෙක්ද කියලා. ඔබට ඔබ ගැනම ආඩම්බරයක් දැනෙයි.

ඉතින් දරුවෙනි, මේ ටිකත් හිත තුළ තබා ගන්න. ජේසු නිතරම බැල්ම හෙලන්නේ, ජේසු නිතරම වඩින්නෙ පිරිසිඳුව, ලස්සනට පිළිවෙලට තියෙන තැන්වලට පමණයි. පිරිසිදු ලස්සන සිත් තියෙන, ඒ කියන්නෙ වෛරය, ක්‍රෝධය , ඊර්ෂියාව, පළිගැනීම නැති දරුවන්ගේ සිත් තුළට පමණයි.

**ඔබට සුබ නව වසරක් වේවා.**







කෙරවලපිටිය සාන්ත ජුසේ මුනිඳුන්ගේ දෙව්මැදුරට අනු බද්ධිත දහම් පාසල් ළමෝ 14 දෙනෙකු පසුගියද ප්‍රථම වරට දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලැබූහ. දේව මෙහෙයෙන් පසුව මීසම් සේවක ගරු රෝෂාන් ප්‍රසාද් පියතුමන් දහම් පාසල් ගුරුවරුන් හා ළමුන් එක්ව ඡායාරූපයකට මුහුණ දුන් අයුරු. **(සිසිල් පෙරේරා සේයා :- නිහාල් පින්තූ)**

## ආදරයේ උල්පත

දස මසක් කුස දරා
මා මෙලොවට බිහි කළේ ඔබයි
පුංචි කල සිට මා වැඩෙන තුරු
මා රැක ගත්තේ ඔබයි
ජීවිත කම්කටොලු හැරද
මා පසු පස ආවේ ඔබයි
නිබඳ රැකවරණය දෙමින්
මා හදා වැඩුවේ ඔබයි

ආදරයේ උල්පත වුනේ ඔබ
අප සැම අතර සැමදා
මගේ ජීවිතයට සඳක් වුන ඔබ
එළියක් වෙමින් සැමදා
ගෙදර බුදුන් වුයේ ඔබ
යහගුණ දෙසමින් සැමදා
අම්මේ ඔබ මා සමගයි
වඳිමි ඔබ පා පියුම් සැමදා

**ඩිල්ෂා කේශානි**
9 ශ්‍රේණිය
විමුක්ති නිවස
මැටියගනේ

පොල්ගහවෙල මීසම් සේවක ගරු මනුර ශිරෝන් පියතුමාගේ ප්‍රධානත්වයෙන් ගරු ඈන් මියුරියල් ප්‍රධාන මව් තුමියගේ මෙහෙය වීම තුළ ලූර්දු දේව මාතා දහම් පාසලේ ළමෝ 16 දෙනෙකු පළමු වරට දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලැබූහ. දිව බොදුන් ලැබූ ළමුන් ළමා ප්‍රදීපය සඳහා සේයා රුවකට පෙනී සිටි අයුරු

**මාලනී පෙරේරා**






**සිතුවම**
**එම්.පි ශානිකා**
**(සෞන්දර්ය කලා විශ්ව විද්‍යාලය )**

**ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ**
**ලෙයොන් ප්‍රනාන්දු**
9 ශ්‍රේණිය
ශාන්ත පීතර විදුහල
බම්බලපිටිය



මා ආදර ජේසු සමිඳුනි
ඔබ හමුවන මොහොත මෙයයි
"ආදර ජේසුනි, මා හට ප්‍රශ්නයක් ඇත.....
ප්‍රශ්නය මම යි ස්වාමිනි,
"මා ආදර දරුව, පිළිතුර මා ළඟ ඇත.
පිළිතුර මම යි.
"මනුෂ්‍යයන්ට කළ නොහැකි දේ දෙවියන් වහන්සේට කළ හැකිය,"
ශු. ලූක් 18:27

**ඉවෝන් අමරසේකර**



# ළමා ප්‍රදීපය නත්තල් කලාපයට සුබ පැතුම්

ආසියාවේ පළවන එකම කතෝලික ළමා පුවත් පත වන "ළමා ප්‍රදීපය" පුවත් පතෙහි 2012 විශේෂ නත්තල් කලාපය ඉතා අරුත්බර ලිපි වලින්, සිත් ඇද ගන්නා සුළු ලෙස මුද්‍රණය කර තිබීම සහ ළමුන්ගේ හැකියාවන් එළි දැක්වීමේ තෝතැන්නක් වූ බැවින් එය ළමුන්ට පමණක් නොව වැඩිහිටියන් හටද ඉතා වටිනා පුවත් පතක් බවට පත්වී ඇත.

මෙම වටිනා කාර්යයෙහි මූලිකත්වය ගන්නා ළමා ප්‍රදීපය පුවත්පතේ ප්‍රධාන සංස්කාරක ගරු ශාන්ත සාගර හෙට්ටිආරච්චි පියතුමාටත්, ළමුන්ගේ ලේඛන හැකියාවන් වැඩිදියුණු කිරීම සඳහා ද වටිනා සේවයක් ඉටු කරන සහය සංස්කාරක කුමර නයනජිත් මහතා ඇතුළු කාර්ය මණ්ඩලයටද හරවත් ලිපි ලිවීමේ කාර්යයෙහි නියුතු සියළු දෙනා හටද ස්තූති පූර්වකව සුභ පැතුම් එක් කරන අතර, ලැබුවාවූ නව වසර තුළද ළමා පරපුරට මෙවන් වටිනා සේවයක් අඛණ්ඩව කරගෙන යාම සඳහා දෙව් ආසිරි වරම් ප්‍රාර්ථනා කර සිටිමි.

ශානක ක්‍රිසන්ත මුහන්දිරම්
මල්කඩුවාව ළමා ධර්මදූත සජීවක



වැලිවිට ශාන්ත මරියා පෙර පාසලේ වාර්ෂික ප්‍රසංගයේදී සිඟිති දැරියන් විසින් ඉදිරිපත් කළ නර්තනයක් - **එම්. ජෝ. පාරිස්**

## ජයග්‍රාහී නිර්මාණය
## දෙසැම්බර් මාසය මාසික සිතුවිල්ල



ඔබෙ මහිමය පසසමු අපි ගී ගයමින්
ජාතිය කුළ භේද නොතකා සැවොම එක්වෙමින්
වියැකී යන එකමුතු කම යළිත් දළු ලමින්
එක්ව යදිමු අප සැම හට ආසිරි දෙන මෙන්

අතීතයේ වූ සුන්දර සිදුවීම
දෙව් පුතු මිනිසත් බව ගෙන මෙලොවට ඒම
සාමයෙ කුමරු ගව ඔරුවේ සැතපීම
නැවත මතක් වෙයි ගවලෙන දකින විට

ප්‍රසාදි ඉරෝෂනී පෙරේරා
8 ශ්‍රේණිය
වික්ෂෝප මාතා දහම් පාසල - ජා-ඇල

........................................................................................................






නාත්තන්ඩිය ලූර්දු මාතා දහම් පාසලේ වාර්ෂික දහම් පාසල් නත්තල් උත්සවය මීසම්පති ගරු උපාලි වර්විල් , සහයක ගරු දුමින්ද සුරේෂ් යන පියතුමන්ලාගේ හා ගරු පැවිදි සොයුරියන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්වුණි. දහම් ගුරු මඩුල්ල එක්ව මෙය මෙහෙය විය. මෙදින අවස්ථාවක් ළමා ප්‍රදීපය කැමරා කාචයේ සටහන් වී තිබූ අයුරු.

**(ශ්‍රියාංගණී පිලීෂියා )**

**මාසික සිතිවිල්ල**

"ජනවාරි මාසය" ළමා ප්‍රදීපය,
අංක 02,
ඥානාර්ථ ප්‍රදීපය මාවත,
කොළඹ 08.

# ක්‍රිස්තියානි ගෘහ නිර්මාණ ශිල්පයේ ආරම්භය හා විකාශනය



සංස්කාරක පියතුමන් විසිනි

මුල් යුගයේ කිතු බැතියෝ තම ආගමික වතාවත් පැවැත්වීමට කැටකෝම්ස් නම් සොහොන් ගෙවල් භාවිත කළ බව සඳහන් වේ. නමුත් ආගමික නිදහස ලැබීමෙන් පසු එම කාර්යය ඉටු කිරීමට ගොඩනැගිලි අවශ්‍යවිය. මුලින්ම මෙම ගොඩනැගිලි ක්‍රිස්තියානියේ ආගමික කාර්යයන් සහභාගි කම, පූප කැඩීම යාච්ඤා කිරීම දේශනා කිරීම ආදී වතාවත් ඉටු කිරීමට හැකිවන පරිදි ගොඩ නැගීමට අවශ්‍ය විය.

ඔවුන්ගේ ප්‍රධානම ආගමික කාර්යය වන පූප කඩා බෙදා ගැනීම සඳහා ඔවුන් මේසයක් වටා රුස්විය. මෙම රුස්වීමේදී රොටි කඩා බෙදා දෙන තැනැත්තා එනම් මූලිකයා කවුද යන ප්‍රශ්නයේදී එක් පුද්ගලයෙක් එම කාර්යය සඳහා මූලිකයා විය. එම නිසා ඔවුන් අතර යම් කිසි නායකත්වයක් බිහිවිය. ඔවුන්ගේ මේ දේව මෙහෙය පැවැත්වීමේදී සෙනග නායකයා වටා රුස්වූ අතර නායකයාට එම කාර්යය ඉටු කිරීමට විශේෂ ස්ථානයක් හෝ ආසනයක් අවශ්‍ය විය.

නායකයෝ කීප දෙනෙක් සිටියා නම් ඔවුන් ප්‍රධාන නායකයා වටා රොක්විය. මෙසේ බිහිවූ නායකත්වය නිසා ගොඩනැගිලි නිර්මාණය කළේ නායකයාට ප්‍රමුඛ ස්ථානයක් දෙමිනි. එම නිසා ගොඩනැගිල්ලේ මැද කොටස උස්ව සාද එම කොටස නායකත්වය දරණ ප්‍රධානියාට වෙන් විය. ඔහු ඉදිරිපිට කොටසේ අනිකුත් ගිහි ජනතාව රුස්විය. මෙය ක්‍රිස්තියානි ගෘහ නිර්මාණ ශිල්පයේ මුල පටන් ගැන්මය.

පසු කලෙක ගිහි පක්ෂයේ වර්ධනය නිසා ඉඩ කඩ ප්‍රමාණවත් නොවුයෙන් මුලින් තිබු ගොඩ නැගිල්ල දෙපැත්තට දික්කර අත් දෙකක් සේ ගොඩ නගන ලදී. හතර වෙනි සියවසේදී තරම ඉඩ කඩ වැඩි කර ගැනීම අදහසින් දෙපස බිත්තිදෙක අතර ආරුක්කු හැඩයක් යෙදවීය. එය කුඩා ගල් කැට වලින් නිර්මාණය කරන්නට ඔවුන් පුරුදු විය.

ආරුක්කු ක්‍රමය පැමිණීම නිසා ගොඩ නැගිල්ලේ පැති තුනේම ඉදිරිපිට ආරුක්කු යෙදවීමෙන් මැද කොටසේ සිටි පූජක පක්ෂය හා එහි සිදුවන වතාවත් ඔවුන් වටා සිටින ගිහි ජනතාවට පැහැදිලිව දර්ශණය කළ හැකිවිය . එනම් ඔවුන්ට පූප කැඩීමේ පිලිවෙතට හොඳ කාර සහභාගි වීමට හැකිවිය.

කුරුසියේ හැඩය ගත් මෙම දේවස්ථාන පසු කලෙක පැති හතරම එක සමාන දිගකින් සමන්විත වූයේද වහලයට ආරුක්කු යෙදවීමෙන්ද බැසිලිකා ශෛලිය බිහිවිය.

පූප කඩනා මේසය පූජක පක්ෂයට වෙන්විය. උස්ව තැනූ මෙම මැද කොටසේ මේසයේ කරන පිලිවෙත සෙනගට හොඳකාර දැක ගැනීමට හැකි නිසා මෙම ආරුක්කු යොද ශෛලිය එනම් බැසිලිකා ශෛලිය පසු කලෙක දේවස්ථාන නිර්මාණයේදී බොහෝ ප්‍රයෝජනවත් විය.

ආරුක්කු යොද බැසිලිකා ශෛලියට තැනු මෙම ගොඩනැගිලි වල වහලය (Dome) එකක් ලෙසට සාදන ලදී. පස්වෙනි හයවෙනි සියවස්වලදී පැවතුන ප්‍රධානම ශෛලිය බැසිලිකා ශෛලියයි. මුලින්ම ගොඩනැගිලිවල වහලයට ඩෝම් එක යොද ගොඩනැගිලි සාදන්නට පටන්ගත්තේ මුස්ලිම් ජනයායි. ඔවුන් එයට බයිසන්ටයින් ශෛලිය කියයි.

පුරාණයේ ඉහත කී අන්දමට දේව මෙහෙයක් පවත්වන්නට ඇතැයි ප්‍රකාශ වන්නේ බයිබලයෙනි. එනම් එළිදරව් පොතේ 4 වෙනි පරිච්ඡේදය 4:4, 6:9 , 8:3, 9 :13 , 14:1-3 දක්වා 16:7 මේ තැන්වල සඳහන්වේ. පුරාණ දේවස්ථාන වල දේව මෙහෙයන් පැවැත්වූ බව සඳහන් වේ.

මෙම දේවස්ථානවල විශේෂ ලක්ෂණයක් නම් පූප කැඩීම බලන්නට එන අමුත්තන්ට හා ශුද්ධවූ සහභාගි කමට හවුල් වීමට බැරි වරද කරුවන් ලෙසට නම් කර සිටින අයට දේවස්ථානයේ වෙනම කොටසක් ඉදිකර තිබීමයි. වරද කරුවන් තම වරදට පශ්චත්තාප වන තුරු දේවස්ථාන ගොඩ නැගිල්ලේ ඉතිරි කොටසට ඇතුලත් වීම තහනම් විය.

ඉතිරිය 14 පිටුවේ

# අවංක කම

ඉවෝන් පෙරේරා
කුරුණෑගල




පුංචි සමන්ති ඉතාමත් දුප්පත් පවුලක ළමයකු විය. ඇගේ මිතුරිය ලසන්තිකා පොහොසත් පවුලක ළමයකු විය. සමන්ති පවුලේ වැඩිමලා වූ අතර ඇයට බාල නංගියෙක් ද මල්ලිලා දෙදෙනෙක් ද විය. ඇගේ පියා මීට අවුරුදු තුනකට පෙර අවසන් හුස්ම හෙලුවේය. එවිට සමන්තිගේ වයස අවුරුදු හයක් විය. අම්මා ද සමන්තිව හා ඇගේ බාල සහෝදරයන්ව ජීවත් කරවීම සඳහා දිවා රෑ නොබලා වෙහෙස මහන්සි වෙනවා. පාසල් පොත් සහ ඇඳුම් පැළඳුම් ලබා දීමට තරම් මුදලක් ඔවුන් අතර ඉතිරි නොවේ. එහෙත් ඇගේ මව ඇයට දුන් එක් අවවාදයක් නම් "යම් කිසි දෙයක් ඇහිලූවිට එය ගුරුතුමිය හට දෙනවා මිස එය තමා ලඟ තබා ගන්නට එපා " කියායි.

දිනක් සුපුරුදු පරිදි ඇය පාසල් යෑමට ලහි ලහියෙ සූදනම් වූවාය. එහෙත් ඇයට ඒ අතර තුරදි පෙර දින ගුරුතුමිය කිවූදෙයක් සිහියට නැඟුණි. එනම්"ඇයි ළමයා ඔය විදියට පාසල් එන්නේ පොතක් පතක් නෑ, පෑනක් පැන්සලක් නෑ, ඔය විදියට ඉගෙන ගන්න පුළුවන්ද? පිරි සිදුව ඇඳුමක් වත් ඇඳ ගෙන එනවා නම් කමක් නෑ. ඔහොම පාසල් එනවාට වැඩිය හොඳයි ගෙදර නවතිනවා" මේ කියුම් ඇගේ සිහියට නැඟුණි.

එවිටම අම්මා ද ඇය ලඟට පැමිණ, "මොකද ළමයෝ ඇස් දෙකේ කඳුලු පුරවාගෙන" කියා ඇසුවාය. එවිට ඇය මවට ගුරුතුමිය කිවූ දෙය කීවාය. මවගේ දෙනෙතේ ද කඳුලුපිරෙන්නට විය. කඳුලු බිඳු අතරින් මව ඇයව සනසවමින් මෙසේ කීවාය. "දුව අදටත් පාසල් යන්න මම හෙට කොහොම හරි පොතක් අරන් දෙන්නම්"

ඉන් පසුව සමන්ති දෙවිඳුන් හට යාච්ඤා කොට මවටද වැඳ පාසල් යෑම සඳහා පාරට බැස්සාය. එසේ පාසල් යන අතර තුරදි ළමුන් ඇය දෙස බලා සිනා සෙන්නට විය. ඇය ඒවා ගණනකට නොගෙන තමාගේ පාඩුවේ ගියාය.

පාසල් බිමට ඇතුලු වූ ඇය කුඩා පිට්ටනිය හරහා ගමන් කරන්නට වූවාය. මේ අතර තුරදි එක් ගුරුතුමියක් කලබලයෙන් කාර්යාලය වෙත ගමන් කරන විට ඇගේ මුදල් පසුම්බිය බිම වැටුනි. මෙය දුටුවේ සමන්ති පමණි. අවට සිටි ළමුන් වත් ගුරුතුමියවත් මෙය නොදුටුවෝය.

මෙය අහුලා ගත් සමන්තිගේ සිතට නොයෙක් දේ ගලා එන්නට විය. පාසල් පොත් , ඇඳුම් පැළඳුම් අර ගැනීමට හැකි බව ඇයට සිතුණි. එහෙත් ඇයට මව දුන් අවවාදය සිහි වුණ විගසම එම මුදල් පසුම්බිය ගුරුතුමිය වෙත ගොස් බාර දුනි. එම ගුරුතුමිය ඇයට බොහෝ සේ ප්‍රශංසා කළාය. එම පසුම්බියේ රු. 250 ක මුදලක් තිබුණි. එය එසේම විය. මේ ගැන අනෙක් ගුරු තුමියන්ටත් පැවැසු මෙම ගුරුතුමිය ළමුන්ට ද කීවාය. ඇය කෙතරම් දුප්පත් වුවත්, ඇගේ අවංක කම ගැන විදුහල්පතිතුමියද ප්‍රශංසා කළා පමණක් නොව ඇයට අවශ්‍ය පාසල් පොත් සැම දෙයක්ම ලබා දීමට පොරොන්දු විය.

මේ ගැන පාසලේ සැම කෙනෙකුම වාගේ පැහැදීමකට පත් විය. ඇගේ මිතුරිය ද අනිත් සෑම දෙනාටම වඩා ප්‍රීති විය. පුංචි සමන්තිට ද පාසල අවසන් වන කම් ඉවසුමක් නෑ. එයට හේතුව මේ ගැන මවට කීමට ඇති ආශාවය.




## හලාවත පදවිය

ගොඩැල්ල මීසමට අයත් තඹරවිල නිර්දෝෂ මාතා දහම් පාසලේ දරු දැරියෝ 20 ක් පසුගියද ප්‍රථම වරට දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලැබුහ.

දේව මෙහෙය මීසම් සේවක ගරු මොරිස් ඇන්ඩසන් මීසම් සහයක ගරු දිනේෂ් දුමින්ද යන පියතුමන්ලා එක්ව පැවැත්වුහ. අනතුරුව එම දරුවන් ගරු පියතුමන් සහ දරුවන්ට දහම ඉගැන්වූ ගුරු මෑණි වරුන් දහම් නියෝජිත මහතා සමග සමූහ ඡායාරූපයකට පෙනී සිටි අයුරු.



සටහන - චාල්ස් ප්‍රනාන්දු සේයා - ඇලෙක්ස්

# ලංකා

## ආදර දුවේ, පුතේ,

සෑම වසරකම ජනවාරි 16 වන දින ලාංකික කිතුනුවන් ලෙස අපගේ භක්ත්‍යාදරයට , ගෞරවාභිමානයටත් ඉමහත් ආඩම්බරයටත් පත්ව ඇති සුවිශේෂී මංගල්‍යයකි. ඒ අප දේශයේ අග්‍රගන්‍ය අපෝස්තුළුවරයාණන්, අප ආදර මුනිවරයාණන් වන භාග්‍යවත් ජුසේ වාස් මුනිඳුන්ගේ මංගල්‍යය යෙදී තිබෙන නිසයි. එදා රුදුරු ඕලන්ද පීඩන යුගයේ වසර 30 ක කාලයක් පුරාවටම පූජාප්‍රසාදිතුමකුගේ පහස නොලත් ලාංකේය කතෝලිකයෝ එඬේරකු නොමැති ව මංමුලාවූ බැටළුවන් සේ විසූ යුගයක , ජීවිතයට එල්ල වන තාඩන පීඩන නොබලා, නොතකා, ලාංකේය ශු. සභාව ගොඩනඟන්නට දෙවිඳුන් විසින් ම අප හෙළදෙරණට ත්‍යාග කළ උත්තරිතර දේවතිළිණය භාග්‍යවත් ජුසේ වාස් මුනිතුමාය. එතුමා පිළිබඳව විවිධ තොරතුරු කරුණු කාරණා අප දැනසිටියද මේ විපරම එතුමාණන්ගේ පාද ස්පර්ශය ලද ස්ථානයන් කීපයක් පිළිබඳවයි.



### ★ සවුත්බාර්

ක්‍රි.ව. 1687 දී සිඟන්නකුගේ වෙස්ගෙන ලාංකේය කතෝලිකයන් වෙනුවෙන් ඇප කැප වන්නට තිර අදිටන් කර ගත් අප අපෝස්තුළුවරයාණෝ තම සහයක ජෝන් නැමැති තරුණයා ද සමඟ මන්නාරම් වෙරළට සේන්දු වූයේ මෙම ස්ථානයේදීය. එතුමාණන් පැමිණෙන විට කුසගින්නෙන් පෙළෙමින් කිසිදු කාය ශක්තියක් නොමැතිව පැමිණි බව සඳහන් වේ.


සවුත්බාර්

### ★ ජේසාලෙයි

ප්‍රධානතම ඔරතෝරියානු මධ්‍යස්ථානයක් වූ ජේසාලෙයි ගම්මානය ක්‍රි.ව. 1705 සිට ප්‍රතිමාවන් මඟින් මෙරට සම්ප්‍රදායික පාස්කු නාට්‍ය, කලාවන් ආරම්භ වූයේ මෙහිදිය. අදත් මෙම පාස්කු සම්ප්‍රදාය නොනැසී පවතී.


ජේසාලෙයි

### ★ පෙරිකරිසාලෙයි

මෙම ස්ථානයේ ජුසේවාස් පියතුමා විසින්ම ස්ථාපිත කරන ලද ශු. කුරුසියක් දක්නට ලැබෙන අතර අද මෙම ස්ථානය මන්නාරම් පදවියේ සිද්ධස්ථානයකි.

### ★ පරපාන්කන්ඩල් දේවස්ථානය

මන්නාරමට කිලෝමීටර 5 ක් මෙපිට පිහිටා ඇති මෙම ඉපැරණි දේවස්ථානය, පෘතුගීසි යුගයේ සිට අද දක්වාම පවතින ඉපැරණි දේවස්ථානයක් වන මෙම දේවස්ථානය ලක්දිව ප්‍රධානතම ඔරතෝරියානු මධ්‍යස්ථානයක් වූ අතර ක්‍රි.ව. 1705 දී ලංකාව ප්‍රධාන මීසම් 08 කට ජුසේවාස් පියතුමා බෙදා දුන්නේ මෙම දේවස්ථානයේ සිටය. තවද ඉපැරණි මීසම් ගෘහයක් පවතින මේ දේවස්ථානයේ අති අලංකාර ක්‍රිස්තුන් වහන්සේගේ දුක්ප්‍රාප්ති ප්‍රතිමාවක් ද, ඉපැරණි පාස්කු නාට්‍යයේ ශේෂ ප්‍රතිමාවන් ද, දක්නට ලැබේ.


පරපාන්ක

### ★ කල්ලෙයිකඩ්ඩයිකඩු ශ්‍රී කුරුසිය

ගෝවා පුර බෝ ආවිස්ථා කන්දේ ප්‍රතිහාර්ය කුරුසියේ ආකෘතියට තනා ඇති මෙම ශ්‍රී කුරුසිය තනවා ඇති අතර මෙම සිද්ධස්ථානය මන්නාරම් පදවියේ ප්‍රධාන සිද්ධස්ථානයකි. මාත්තෙයි ග්‍රාමයේ තිබූ මරුද මඩු මාතාවන්ගේ ප්‍රතිමාව මුලින්ම තැම්පත් කර තිබුනේ ද මෙම සිද්ධස්ථානයේ ය.


කල්ලෙයිකඩ්ඩයිකඩු ශ්‍රී කුරුසිය

### ★ සිලේනා මරුද මඩු සිද්ධස්ථානය

ඕලන්ද යුගයේ දී ප්‍රධානතම ඔරතෝරියානු මධ්‍යස්ථානයක් වූ මරුද මඩු සිද්ධස්ථානයේ

# ... අපෝස්තුළුවරයාණෝ


...න්ඩල් දේවස්ථානය

ආරම්භකයා ලෙස ප්‍රකට වන්නේ අතිගරු පෙද්‍රෝ ෆෙරාඩ් ඔරතෝරියානු නිකායික පූජාප්‍රසාදිතුමාය. භාග්‍යවත් ජුසේවාස් මුනිතුමා ක්‍රි.ව.1690, 1698, 1703 සහ 1705 යන කාල පරිච්ඡේද වල මෙම සිද්ධස්ථානයේ ධර්මදූතික මෙහෙවරේ යෙදුණු අතර අද ලාංකේය ශු. සභාවේ ප්‍රධානතම හා ලක්ෂ සංඛ්‍යාත ජනතාවක් නිතිපතා රැස්කරන වන්දනා ස්ථානය වේ.

### ★ සෙට්ටිකුලම

මන්නාරම පාරේ සෙට්ටිකුලම දේවස්ථානයට යාබදව පිහිටා ඇති ඓතිහාසික පලු ගසක බෙනයක් තුළ භාග්‍යවත් ජුසේ වාස් පියතුමා විසින් ස්ථාපිත කරන ලද ඓතිහාසික ශ්‍රී කුරුසියක් තවමත් ස්ථාපිත අතර , මේ කුරුසිය එතුමාණන් විසින් ස්ථාපිත කර ඇත්තේ වල් අලින්ගෙන් හා වන සතුන්ගේ උවදුරු වලින් ජනතාව මුදවා ගැනීම සඳහාය.

### ★ අරිප්පු

මන්නාරමට නුදුරින් පිහිටා ඇති මෙම ශ්‍රී කුරුසිය ද ගෝවේ ප්‍රාතිහාර්ය ශ්‍රී කුරුසියෙ මුහුණුවරට ම ජුසේවාස් පියතුමා විසින් ස්ථාපිත කර ඇත.

### ★ සිල්ලාලෙයි

යාපන අර්ධද්වීපයේ ප්‍රධානතම කිතුනු මධ්‍යස්ථානයක් ලෙස ඕලන්ද යුගයේ පැවති ස්ථානය වුයේ ‘‘සිල්ලාලෙයි’’ ග්‍රාමය වේ.


සෙට්ටිකුලම


සිල්ලාලෙයි



සිලේනා මරුද මඩු සිද්ධස්ථානය

ජුසේවාස් පියතුමා ක්‍රි.ව. 1687 - 1689 දක්වා කාලය පුරාවටම මෙම ප්‍රදේශයේ සේවය කළ අතර කොඩිගස මෙරටට හඳුන්වා දුන්නේද මෙම ග්‍රාමයේය. තවද ලිඛිත හා ජනප්‍රවාද වලට අනුව භාග්‍යවත් ජුසේවාස් මුනිඳුන්ගේ ශ්‍රී හස්ත වලට දේව බිළිඳාණන් වැඩම කළේද, මේ ග්‍රාමයේය. තවද ‘‘මරියානගම්’’ පරපුරවෙත එතුමාණන් දානය කළ ශ්‍රී කුරුසිය අදත් මෙහි වෙසෙන ඔවුන්ගේ 7 වන පරපුරේ සමාජිකයන් සතුව ඇත.


අරිප්පු

### ★ පුත්තලම

එකල සිංහල රජුට අයත්ව පැවති එකම වරාය වූයේ පුත්තලම වරාය. මෙය සනරකෝරළයේ ප්‍රධාන නගරය වූ අතර, ජුසේවාස් පියතුමාගේ සහ ඔරතෝරියානු පූජා ප්‍රසාදිවරුන්ගේ ප්‍රධානතම ධර්මදූතික මධ්‍යස්ථානය, පූජකහල හා සුසාන භූමිය ද පුත්තලමේ පිහිටා තිබු අතර ක්‍රි.ව. 1746 දී විජය රාජසිංහ රජු විසින් මෙම පූජකහල විනාශ කළ අතර එම ස්ථානයේ අද ඉතිරි ව ඇත්තේ එකම එක තාප්පයකි.

ඉදිරි කලාපයෙන්.....

**අසේල දසනායක**



# ඉංග්‍රීසි පාඩම විශේෂයෙන් අ.පො.ස. (සා. පෙළ හා උ. පෙළ) සිසු සිසුවියන් සඳහා

ඉදිරිපත් කිරීම මයිකල් ඇන්ජලෝ ප්‍රනාන්දු විසිනි.

පාඩම් අංක : 82

## (03) Prepositions වරදවා යෙදීම.

16. (w) I can read this **from** the light of the moon. ✗
මට මේ පිටුව හඳ එළියෙන් කියවන්න පුළුවන්.
(c) I can read this **by** the light of the moon. ✔
(අයි කැන් රීඩ් දිස් පේජ් බයි ද ලයිට් ඔෆ් ද මූන්.)

17. (w) Please send you letter **on** my adress in Colombo. ✗
කරුණාකර ඔබේ ලිපිය මගෙ කොළඹ ලිපිනයට එවන්න.
(c) Please send you letter **to** my address in Colombo ✔
(ප්ලීස් සෙන්ට් යු ලෙටර් ටු මයි ඇඩ්රස් ඉන් කලම්බො.)

18. (w) This car is made **of** Japan. ✗ මේ කාරෙක සාදන ලද්දේ ජපානයේ. (c) This car is made **in** Japan. ✔
(දිස් කා(ර්) ඉස් මේඩ් ඉන් ජැපෑන්.)

19. (w) He is suffering **by** fever. . ✗ ඔහු උණ රෝගයෙන් පෙලෙනවා. (c) He is suffering **from** fever. ✔ (හී ඉස් සෆරිං ෆ්‍රොම් ෆීවර්.)

20. (w) I have done this job **since** the last six months. ✗
මම පහුගිය මාස හය තුළදීම මේ වැඩේ කළා.
(c) I have done this job **for** the last six months. ✔
(අයි හැව් ඩන් දිස් ජොබ් ෆො ද ලාස්ට් සික්ස් මන්ත්ස්)

21. (w) I changed my plan in accordance **to** your suggestion. ✗
ඔබේ යෝජනාවට අනුව මගේ සැලැස්ම වෙනස් කළා.
(c) I have changed my plan in accordance **with** your suggestion. ✔ (අයි හැව් චේන්ජ්ඩ් මයි ප්ලැන්ස් ඉන් එකෝඩන්ස් විත් යුවර් සජෙෂන්)

22. (w) Can I get a taxi **in** the railway station? ✗
මට දුම්රිය පළෙන් ටැක්සියක් ගන්න පුළුවන්ද?
(c) Can I get a taxi **at** the railway station? ✔
(කැන් අයි ගෙට් ද ටැක්සි ඇට් ද රේල්වේ ස්ටේෂන්.)

23. (w) The dog plunged **in** the river and swam. ✗
බල්ලා ගඟට පැනලා පීනුවා. (c) The dog plunged **into** the river and swam. ✔ (ද ඩෝග් ප්ලන්ජ්ඩ් ඉන්ටු ද රිවර් ඇන්ඩ් ස්වැම්)

24. (w) His knowledge of English gives him great advantage **above** me. ✗ ඔහුගේ ඉංග්‍රීසි දැනුම මට වඩා ඔහුට වාසියක්ව පවතිනවා. (c) His knowledge of English gives him great advantage **over** me. ✔ (හිස් නොලේජ් ඔෆ් ඉන්ග්ලිෂ් ගිව්ස් හිම් ග්‍රේට් අඩ්වාන්ටේජ් ඕවර් මී.)

25. (w) Water is a chemical compound composed **with** oxygen and hydrogen. ✗ වතුර කියන්නෙ ඔක්සිජන් සහ හයිඩ්‍රජන් එක්වූ රසායනික සංයුතියක්. (c) Water is a chemical compound composed **of** oxygen and hydrogen. ✔ (වෝට(ර්) ඉස් අ කෙමිකල් කම්පවුන්ඩ් කොම්පෝස්ඩ් ඔෆ් ඔක්සිජන් ඇන්ඩ් හයිඩ්‍රජන්)

26. අපි සීගිරියට "ට්‍රිප්" එකක් ගියා.
(w) We went for picnic to Sigiriya. ✗ (වැරදියි)
(w) We went a picnic to Sigiriya. ✗ (වැරදියි)
(w) We went picnic Sigiriya. ✗ (වැරදියි)
(c) We went on a picnic to Sigiriya. ✓ (නිවැරදියි)
(වී වෙන්ට් ඔන් අ පික්නික් ටු සීගිරිය)

27. එයා මේ දවස් වල නිවාඩු
(w) He is holiday these days. ✗ (වැරදියි)
(w) He is at holidays these days. ✗ (වැරදියි)
(w) He is on holidays these days. ✗ (වැරදියි)
(c) He is on holiday these days. ✓ (නිවැරදියි)

(c) We went on a journey to kandy. ✓ (නිවැරදියි)
(වී වෙන්ට් ඔන් අ ජර්නි ටු කැන්ඩි) අපි මහනුවර චාරිකාවක යෙදුනා.

(c) e went on a tour to Lourdes. ✓ (නිවැරදියි)
(වී වෙන්ට් ඔන් අ ටුවර් ටු ලූඩ්ස්) අපි ලූර්දු වලට සංචාරයක යෙදුනා

(c) He went to Malaysia on business. ✓ (නිවැරදියි)
(හී වෙන්ට් ටු මැලේෂියා ඔන් බිස්නස්) ඔහු බිස්නස් සඳහා මැලේසියාවට ගියා..

(c) Please pay in cash. we don't accept cheques. ✓ (නිවැරදියි)
(ප්ලීස් පේ ඉන් කැෂ්. වී ඩෝන්ඩ් ඇක්සෙප්ට් චෙක්ස්)
කරුණාකර මුදලින් ගෙවන්න. අප චෙක්පත් භාර නොගනිමු.

(c) You cam pay some bills by cheque. ✓ (නිවැරදියි)
(යූ කැන් පේ සම් බිල්ස් බයි චෙක්)
සමහර බිල්පත් චෙක් පත්වලින් ගෙවන්න පුළුවන්.

(c) Pay in cash - පේ ඉන් කැෂ් ✓ (නිවැරදියි)
(c) Pay by cheque - පේ බයි චෙක් ✓ (නිවැරදියි)
(c) Pay by credit card - පේ බයි ක්‍රෙඩිට් කාඩ් ✓ (නිවැරදියි)

(c) I Paid for my books by credit card. ✓ (නිවැරදියි)
(අයි පේඩ් ෆො මයි බුක්ස් බයි ක්‍රෙඩිට් කාඩ්)
මගෙ පොත් වලට ගෙව්වෙ ක්‍රෙඩිට් කාඩ් එකෙන්.



නාගොඩ , කළුතර ශු. මිකායෙල් අග්‍රදූත දේව මැඳුරේ දහම් පාසලේ ත්‍යාග ප්‍රදානෝත්සවය පසුගියදා මීසම් සේවක ගරු නිර්මාල් මාලක පියතුමන්ගේ ප්‍රධානත්වයෙන් දෙව්මැදුරේදී පැවැත්වුණි. මෙවර පදවි ධර්මෝපදේශ පරීක්ෂණයෙන් ඉහල ලකුණු ලබා ගත් සිසු සිසුවියෝ රැසක් මෙදින සහතික පත් හා ත්‍යාග ලැබූහ. දහම් පාසලේ ආචාර්ය මඩුල්ල එක්ව මෙය සංවිධානය කළහ.




පසුගියදා මෙම දහම් පාසලේ ළමුන් සඳහා පැවැත්වූ ළමා ලේඛක වැඩමුළුවේදී ලබාදුන් ලේඛක අභ්‍යාසයෙන් ජය ලැබූ ළමුන් හට විශේෂ තිළිණ ලබාදීමට ගරු මාලක පියතුමන් කටයුතු යොදා තිබිණි.

ලේඛක වැඩමුළුව මෙහෙයවූ ඥානාර්ථ ප්‍රදීපය හා ළමා ප්‍රදීපය සහය සංස්කාරක කුමර නයනජිත් මහතා අතින් දස්කම් පෑ දරුවකු ත්‍යාග ලබන අයුරු සේයාරුවෙහි දිස්වේ.

**සටහන - රංජිත් නෝනිස / සේයා - සුනෙත් ප්‍රනාන්දු**

**පමුණුවිල ශු. ජුසේ මුනිඳුන්ගේ දහම් පාසලේ වාර්ෂික ත්‍යාග ප්‍රදානෝත්සවය හා විවිධ ප්‍රසංගය පසුගියදා කොළඹ අගරදගුරු පදවි ජනවන්දනා අධ්‍යක්ෂ ගරු ඉන්ද්‍රජිත් පෙරේරා පියතුමන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්වුණි.**

**මීසම් සේවක ගරු ජුඩ් ශ්‍යාමන් , මීසම් සහයක ගරු දිනුෂ ගයාන් යන පියතුමන්ලාත්, දළුගම ශු. පවුලේ කන්‍යාරාමයේ ප්‍රධාන මව්තුමිය ඇතුලු ගරු පැවිදි සොයුරි යන්ගේද සහභාගිත්වයෙන් පැවති මෙයට දහම් පාසලේ දැරියන් එක්ව නර්තනයක් ඉදිරිපත්කළ අයුරු**



**ඩී.එල්. බැසිල් ආර් පෙරේරා**



පමුණුගම දහම් පාසලේ වාර්ෂික ත්‍යාග ප්‍රදනෝත්සවය මිසම් සේවක ගරු ආනන්ද විතාන පියතුමාගේ ප්‍රධානත්වයෙන් ගොන්සාල්වෙස් විදුහල්ශාලාවේදී පැවැත්වුණි. මෙදින ඉදිරිපත් කළ විශේෂාංගයක් මෙහි දිස්වේ.

**(බෙන්ජමින් කිරිහෙට්ටි)**

කටුවපිටිය සා. සෙබස්තියන් දහම් පාසලේ උත්සවය මීගමුව කලාපීය දහම් පාසල් අධ්‍යක්ෂ ගරු දිනේෂ් ප්‍රියශාන්ත පියතුමාගේ ප්‍රධානත්වයෙන් පාස්කු රංග ශාලාවේදී පැවැත්වුණි.

මීසම් සේවක ගරු ශ්‍රීකාන්ත ප්‍රනාන්දු, සහය මීසම් සේවක ගරු ඩිල්රන් පීරිස් යන පියතුමන්ලාගේ මූලිකත්වයෙන් දහම් ගුරු මණ්ඩලය එක්ව මෙය සංවිධානය කරන ලදි.

**(ඇග්නස් සියඹලාපිටිය)**

# 2012 වසරේ පැවැත්වූ නිර්මාණකරන වැඩමුළුවන් හි ජයග්‍රාහී නිර්මාණ නොවූ සාර්ථක සිතුවම්

## පුංචි අපේ චිත්‍ර පිටුව

පුංචි අපේ චිත්‍ර පිටුව සඳහා ඔබ අඳින චිත්‍ර, පාසලේ හෝ දහම් පාසලේ පංතිභාර ගුරුතුමාගේ සහතිකය සමග ඔබේ නම. පංතිය. පාසල ඇතුළත්ව ඔබේ පෞද්ගලික ලිපිනය හා දුරකතන අංකය ද සහිතව යොමු කරන්න.

"පුංචි අපේ චිත්‍ර පිටුව"
ළමා ප්‍රදීපය, අංක 02,
ඥානාර්ථ ප්‍රදීපය මාවත, කොළඹ 08.



**හිරුණි මල්ෂා**
8 ශ්‍රේණිය
සිරිහඳ දහම් පාසල
බොල්ලත



**ශෙනෙලා පීරිස්**
9 ශ්‍රේණිය
ලූර්දු දේව මාතා දහම් පාසල
නාත්තන්ඩිය



**තිලිනි කෞශල්‍යා**
11 ශ්‍රේණිය
සිරිකුරුස දහම් පාසල
මුන්නක්කරය (මහවීදිය මීසම )



**මේරි ඉෂාන්ති ලක්මිණි**
ක්‍රිස්තු රාජ දහම් පාසල
තල්විල



**මේරි ෂෙහානා සඟිනිකා**
8 ශ්‍රේණිය
ආරෝග්‍යමාතා දහම් පාසල පල්ලන්වේනවත්ත
(දළුපත මීසම )



**නිමේෂා ලක්ෂානි**
9 ශ්‍රේණිය
සා. මරියා දහම් පාසල
නායකකන්ද

# වනවාසි ශු. අන්තෝනි මුනිතුමා

## සුදුවර චරිතයක් හඳුනාගනිමු

ක්‍රි.ව. 2 වන සියවසේ දී විසූ ප්‍රබල ශුද්ධවතුන් අතර වනවාසී ශු. අන්තෝනි මුනිඳුන්ට හිමි වන්නේ සුවිශේෂී ස්ථානයකි. ක්‍රි.ව. 251 දී හේරාක්ලේපොලිස් මග්නා (ඊජිප්තුවේ) උපත ලද වනවාසි ශු. අන්තෝනි මුනිතුමා පෙරදිග තාපස දිවියේ පිතෘවරයාණන් ලෙස ගෞරවාභිමානයෙන් සලකනු ලබයි. මෙතුමා ජීවත් වූ පරිසරය තුළ විශේෂයෙන් ශු. සභාවට එල්ල වූ පීඩන සමයකි.

එකල ඊජිප්තුව පෙරටුකොට ගත් ඇලෙක්සැන්ඩ්‍රියා නගරය , පෙරදිග කිතුනු මධ්‍යස්ථානයක් ලෙස මුල් සියවස් තුන තුළ ප්‍රබල ස්ථානයක් විය. මෙතුමාගේ ජීවිතය පිළිබඳ තොරතුරු සෙවීමේදී තුරුණු දිවියේ දී තම මා පියන්ගේ වියෝව මෙතුමන්ගේ දිවියට එල්ල වූ ප්‍රබල මරුපහරක් විය. කෙසේ හෝ එම තත්වය තුළ සිත් පහදා ගෙන අවු 18 දී කාන්තාරයේ දුෂ්කර ක්‍රියා තුළින් දැඩි තාපස දිවියකට මුලපිරීය.

මේ කාලයේදී මුළු ඊජිප්තුව පුරා ක්‍රිස්තු ධර්මය ප්‍රබල ව ව්‍යාප්ත වූයෙන් , තුරුණු වියේදී අන්තෝනිතුමා ද කිතු දහම වැළඳගෙන , ''ශු. ලියවිල්ලේ සඳ හන් '' ඔබ සර්වසම්පූර්ණ වීමට කැමැත්තේද ? යන්න ඔබ ගොස් ඔබ සතු සියල්ල විකුණා දිළිඳුන්ට දෙන්න මන්ද ඔබ හට ස්වර්ගීය සැප සම්පත් උරුම වනු ඇත. එන්න මා අනුගාමි වන්න'' (මතෙව් 19/21) යන ශු. ලියවිලි පාඨය තමන් සතු කරගෙන තමන් සතු සියල්ල ත්‍යාජ කොට ලෞකික සැප සම්පත් හැර පියා , ස්වර්ගීය සැපත කරා ඇලුම්ව වනගත තාපස දිවියකට මුලපිරීය.



මන්ද මෙකල ශු. සභාවට රෝමානු අගරජවරුන් විසින් පීඩන එල්ල කර තිබුනෙන් ශු. සභාවට අඛණ්ඩ යැදුම් ක්‍රියාදාමයක් අවශ්‍යව තිබුණි. මේ නිසාම මර්ධන ක්‍රියාවන් හා තාපස දිවියකට මුලපුරා අන්තෝනි මුනිතුමා ඇරඹූ දැඩි කඨුර දුෂ්කර දිවිය තුළින් මේ යුගයේ විසූ කිතුනුවන්ට ප්‍රබල ලෙස තම විශ්වාසයට සාක්ෂි දරා දිවි පුද දෙන්නට තරම් අභිත ධෛර්යයක් ලැබිණි. කල්යත්ම එතුමන් අනුගාමී වූ පිරිස් හා සම්බන්ධව පෙරදිග කිතුනු තාපස දිවියකට මුලපිරූ අන්තෝනි මුනිතුමා ඔවුන් උදෙසා තාපසික නීති හා නියෝග වලින් සමන්විත ව්‍යවස්ථා වලියක් ද සම්පාදනය කරන ලදි. තවද මෙතුමන්ගේ සුදුවර බව හා ආදර්ශමත් ජීවිත රටාව නිසාම එකල ඊජිප්තුවේ විසූ රෝමානු ආණ්ඩුකාරවරුන්ගේ සිත් දිනා ගැනීමට ද හැකිවිය.

මෙම තාපස දිවිය මුලු පෙරදිග ආසියාකරයේ ම හා ඊජිප්තුව ආශ්‍රිත ප්‍රදේශ වල ව්‍යාප්ත වූ අතර එතුමන්ගේ ආධ්‍යාත්මික ඉගැන්වීම් නිසා මුළු සුළු ආසියාකරයේ තාපසික නවෝදයකට මුලපිරිය. පසු කාලීනව මෙතුමන්ව අනුගාමි පිරිස් අතර , මෙතුමන්ගේ නීති හා ව්‍යවස්ථාවලිය උපයෝගි කොට, ශු. බෙනදික්තුමා ද තාපසික දිවියට අවැසි නීති පොත සකස් කළේය. තවද මෙතුමාගේ ඉගැන්වීම් හා ආධ්‍යාත්මික දිවියට මඟ පෙන්වීම සකස් කළ පියවිලි හා කෘතීන් රාශියක් සම්පාදනය වී තිබෙන අතර, පසුකාලීන ව තාපස දිවියේ ආධ්‍යාත්මික ගුණ වගාවට අත්වැලක් ද, ශු. සභා නිල යැදුම වන යාම යැදුම් සංග්‍රහය සඳහා මෙම ඉගැන්වීම් වල කොටස් කීපයක් ම සම්පාදනය කොට ගැනුණි.

අදත් පෙරදිග සභා තුළ ප්‍රබල ශුද්ධවන්තයකු ලෙස මෙතුමා සැලකෙන අතර, ග්‍රීක ඕර්තඩොක්ස් සභාව, ඊජිප්තුවේ කොප්ටිකා , සීරෝ මලබාර් හා මලන්කාර පිළිවෙත් වලද එංගලන්ත සභාව හා ලුතර්වාදී සභාවන් ද වනවාසි ශු. අන්තෝනි මුනිතුමන් ට ගෞරවාදරයෙන් පිදුම් කරනු ලබති. මෙතුමන්ගේ මංගල්‍යය ජනවාරි 17 වන දින සමරනු ලබයි.

අසේල දසනායක

# ප්‍රහේලිකා අංක 35




සැකසුම

තිළිණි
දුතිකා
පෙරේරා

**හරහට**

1. මංගලම් කීමට පැමිණි ගාබ්‍රියෙල් දේවදූතයාට මරිය තුමිය පැවසුවේ ''බලන්න මම ස්වාමීන් වහන්සේගේ ..... වෙමි. ඔබ පැවසූ ලෙස මට සිදු වේවා'යි යනුවෙනි. මෙහි හිස්තැනට සුදුසු වචනය.

3. .......... වරදවා ගැනීම , පය ලිස්සා වැටීමට වඩා අයහපත්ය'' යනුවෙන් උපදේශකයා හෙවත් සිරාක් පවසයි.

4. මරියතුමියගේ උදන ගීතයේ මෙසේ සඳහන් වේ. සමිඳාණෝ මහා නරපතීන් සිය සිහසුන්වලින් ....හෙලා දීනයන් ඉහල නංවා උසස් කළ සේක. මෙහි හිස්තැනට සුදුසු වචනය

5. ක්‍රිස්තුන් වහන්සේ සුවකළ ලාදුරු රෝගීන් දස දෙනාගෙන් උන්වහන්සේට ස්තුති කිරීමට නොපැමිණි සංඛ්‍යාව

7. මෙහි ඉඩකඩ නොමැති වූයෙන් ජේසු බිළිඳුගේ උපත සිදු වූයේ ගවලෙනකය.

**පහළට**

1. මරිය තුමීය දේව මාතාවන් ලෙස තෝරා ගන්නා විට එතුමිය .....රජ පරපුරෙන් පැවත එන ජුසේතුමා හට විවාහ ගිවිසුම් දී සිටියාය. මෙහි හිස්තැනට සුදුසු වචනය

2. මරිය තුමියගේ උදන ගීයේ මෙසේ සඳහන් වේ සමිඳාණන් සාගිනි වුවන්.... දෙයින් සතප්වා ධනවතුන් හිස් අතින් හරවා යැවූ සේක. මෙහි හිස්තැනට සුදුසු වචනය

3. ස්නාවක ජුවාම් තුමාගේ එක් දේශනයකදී මෙසේ ප්‍රකාශ කළේය. ....... හොඳ හැටි පිරිසිදු කරන පිණිසත් ධාන්‍ය පෙළා සිය අටුවෙහි රැස්කරන පිණිසත් ක්‍රිස්තුන් වහන්සේ අතේ කුල්ල ඇත. මෙහි හිස්තැනට සුදුසු වචනය

5. ස්නාවක ජුවාම් තුමා උපදින විට සකරියස්තුමා ගොළු ව සිටිය බැවින් තම පුත්‍රයාට දිය යුතු ......... ගල්ලෑල්ලක ලියා පෙන්වූ බව ශු. බයිබලයේ සඳහන් වේ. මෙහි හිස්තැනට සුදුසු වචනය

6. අප ලෝකයේ ආලෝකය විය යුතු බවත් මිනිස්සු පහනක් දල්වා බඳුනක් ..... නොව පහන් රුකක් මත තබා සියල්ලන්ට එළිය ලබා දෙන බව ක්‍රිස්තුන් වහන්සේ වදාළ සේක.

(මෙම ප්‍රහේලිකාව පිරවීමේදි පහත සඳහන් බයිබල් පාඨ උපයෝගී කරගත හැකිය. ශු. ලූක් 1,2,3,4, 17, 19, උපදේශකයා හෙවත් සිරාක් 20, ශු. මතෙව් 5 )

06 පිටුවෙන්...

## ක්‍රිස්තියානි ගෘහ නිර්මාණ ශිල්පයේ ආරම්භය හා විකාශනය.....

කල් යෑමේදී පූජාසනයට මුල් තැනක් දීමේ අදහසින් පූජාසනය උස්කර සාදා ඊට ඉහලින් උඩු වියනක්ද බඳින ලදී. එමෙන්ම පූජාසනය වටා දැවයෙන් හෝ යකඩ වලින් වැටක් බැඳීමෙන් එය ආවරණය කර එම ස්ථානය ශුද්ධ ස්ථානයක් ලෙසට සලකන ලදී. කුරුසියේ හැඩයට තනන ලද. මෙම දේවස්ථානවල පසු කලෙක එක් එක් පූජකයින් සඳහා එක එක පූජාසන ගොඩනැගිල්ලේ හතර පැත්තේ සාදා ඇති බව පෙනේ. මුල් කාලීන ක්‍රිස්තියානි දේවස්ථාන ආකෘතිය මෙසේ විය. මීට අමතරව විවිධ ශෛලීන් මෙම දේවස්ථාන නිර්මාණයට ඇතුළු වීමෙන් ඒ ඒ ශෛලින්ට අනුව දේවස්ථාන සාදන ලදි. එනම්

- ★ නෝර්මන් ශෛලීය
- ★ ගොතික් ශෛලීය
- ★ බයිසන්ටයින් ශෛලීය
- ★ බැරොක් ශෛලීය
- ★ වික්ටෝරියන් ශෛලීය
- ★ මොඩන් ශෛලීය

මේවා අතරින් බයිසන්ටයින් සහ ගොතික් යන ශෛලි දෙක ප්‍රධාන තැනක් ගනී. මන්ද බොහෝ දේවස්ථාන සාදා ඇත්තේ එම ශෛලීන්ගේ ආභාෂය ලබමින්ය. ඒ සමඟම කිව යුත්තක් වන්නේ වර්තමාන දේවස්ථාන සකස් වී ඇත්තේ විවිධ ගෘහ නිර්මාණ ශෛලීන්ගේ මිශ්‍රනයක් ලෙසටය. කෙසේ වෙතත් ගෘහ නිර්මාණ ශිල්පයේ එක් එක් අංශයට අයත් මූලික විශේෂාංග ඇත.



කිරිමාටියාගාර මීසමේ හීන්කෙන්ද, දළුපිටිය , කොපිවත්ත කිතුනු ඒකක මගින් පැවැත්වූ නත්තල් කැරොල් ළමා රැඟුම් සහිත විවිධ ප්‍රසංගයේ අවස්ථාවකි මේ. මීසම් සේවක ගරු රෝෂාන් ප්‍රනාන්දු පියතුමන්ගේ මෙහෙයවීමෙන් මෙය පැවැත්විණ.

එච්.ඒ. කල්දේරා


රජ කුමාරයයි කිඳුරු කුමාරියයි
කතාව:
ආනන්ද කල්දේරා
දෙබස්, චිත්‍ර:
ඇස්.ඒ.පී. සමරආරච්චි..
29
මැණියෙනි.. මම කුමාරයාට ආදරෙයි..
හ්ම්.. කමක් .. නැහැ
..මගෙ කුමාරිගෙ ආශාවනෙ
..මම ඉඩ දෙනව ඔයාට..
මම ඔයාව කුමාරයාට බන්දල දෙනව..
ඒක අහපු කුමාරිට පුදුම විදිහෙ සතුටක් ඇතිවුනා.. එවිට මන්ත්‍රකාරිය...
කුමාරි ඔයා දැන්ම ගිහිං කුමාරයාව මේ ලෝකෙට එක්ක එන්න..
කුමාරයාට දියයටින් එන්න වරයක් මම දෙන්නම් එයාව දැන්ම එක්ක එන්න..
එසැණින් කුමාරිත්, මන්ත්‍රකාරිගෙ දුවත් ආයෙමත් මුහුදෙන් උඩට ගියා.. ගිහින් හලි පර්වතය උඩ මාලිගාවෙ හිටපු කුමාරයාව කිඳුරු විමානෙට කැන්දන් ආවා..
කුමරුණි මේ මගේ මැණියන්
මට සමාවෙන්න රැජිණියනි
එයාගෙ අතේ තිබුන මන්ත්‍ර යෂ්ටියෙන් කුමාරිට පහරක් ගැහුවා එසැණින් කිඳුරු කුමාරියගේ වරල.. නැතිවී ගොස් දෙපයින් ඇවිදින ලස්සන කුමාරියක් බවට පත්වුනා...
කුමරුණි මිනිස් ලොවේදී මගේ කුමාරිව හොඳින් බලාගන්න ඔබගෙන් පසු මේ කිඳුරු විමානෙ අධිරාජිණිය වෙයි ඔහු ඔබට මේ භාරදෙන්නෙ..
හොඳයි කිඳුරු රැජිණියනි...
මන්ත්‍රකාරිය දැන් තියේ වරය.. මගෙ කුමාරිව
..මනුලොව ඇවිදගෙන යාමට හැකි ලස්සන ..කුමරියක් කරන්න..
වහා මායාකාඩුපත ඉදිරියට ගිය මන්ත්‍රකාරිය.. ටික වෙලාවක් කිඳුරු මන්ත්‍ර ජපකර...
किन्नर देवि नमः

# ශු. ප්‍රැන්සිස් මුණිඳුන්ගේ කතාව

# අසීසි නගරයේ දිළින්දා

ඉදිරිපත් කිරීම – ආමල් ද සිල්වා

07




